# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1764/23 – 2012 ජුනි 29 වැනි සිකුරාදා – 2012.06.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම්, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය, ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම මෙයින් ප්‍රකාශ කරමි.

කොළඹ දිස්ත්‍රික්කයේ, කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පල්ලෙපත්තුව සුළු කොට්ඨාසයේ හෝකන්දර ගමේ පිහිටි කොළඹ කොට්ඨාස භාර මැනුම් අධිකාරි විසින් 2012.02.28 දිනැතිව පිළියෙල කරන ලද අංක සීඕ/කේඩීඩබ්/2012/31 දරන ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර 'ඒ' සහ 'බී' වශයෙන් පෙන්නුම් කර ඇති මුළු ප්‍රමාණයෙන් හෙක්. 1.2620ක් පමණ වූ පහත සඳහන් නම්වලින්, ප්‍රමාණයන්ගෙන් සහ මායිම්වලින් යුක්ත ඉඩම් කොටස් දෙක:

01. **කැබලි අක්ෂර 'ඒ' – අමරගොඩ පාරේ වරි. අංක 533 දරන ඉඩම – ප්‍රමාණය: හෙක්. 1.1329ක් පමණ**

උතුරට: අමරගොඩ පාරේ වරි. අංක 537/21, 537/1, දරන ඉඩම් සහ අමරගොඩ පාර; නැගෙනහිරට: අමරගොඩ පාර සහ කැබලි අක්ෂර බී; දකුණට: කැබලි අක්ෂර බී සහ පිට ඇළ; බටහිරට: පිට ඇළ සහ මහ කුඹුරඹිවිට.

02. **කැබලි අක්ෂර බී – වරි. අංකය හෝ හිමිකම් කියන අය සොයාගත නොහැකි ඉඩම – ප්‍රමාණය: හෙක්. 0.1291ක් පමණ**

උතුරට: කැබලි අක්ෂර ඒ සහ අමරගොඩ පාර; නැගෙනහිරට: අමරගොඩ පාර සහ වරි. අංක 531/8 දරන ඉඩම; දකුණට: අමරගොඩ පාරේ වරි. අංක 531/8 දරන ඉඩම සහ පිට ඇළ; බටහිරට: පිට ඇළ සහ කැබලි අක්ෂර ඒ.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

යොමු අංකය: 4/3/4/2011/ඩී/305.
2012 මැයි මස 22 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
අංක 1200/06, "මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

07 – 399

---

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය, ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම මෙයින් ප්‍රකාශ කරමි.

කොළඹ දිස්ත්‍රික්කයේ, කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පල්ලෙපත්තුව සුළු කොට්ඨාසයේ තලංගම ගමේ පිහිටි කොළඹ කොට්ඨාස භාර මැනුම් අධිකාරි විසින් 2012.02.28 දිනැතිව පිළියෙල කරන ලද අංක සීඕ/කේඩීඩබ්/2012/32 දරන ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර 'ඒ' වශයෙන් පෙන්නුම් කර ඇති මුළු ප්‍රමාණයෙන් හෙක්. 0.6588ක් පමණ වූ දේසිංහ මාවතේ අංක 627/ඒ/12 දරන පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කොටස:

උතුරට: පාර සහ සාම මාවතේ වරි. අංක 225/50 දරන ඉඩම; නැගෙනහිරට: සාම මාවතේ වරි. අංක 225/50 දරන ඉඩම, බිරුක්ටර් හිමිකම් කියන වරි. අංකය සොයාගත නොහැකි ඉඩම සහ දිල්නා තේ කර්මාන්ත ශාලාව සතු ඉඩම; දකුණට: පිට ඇළ; බටහිරට: දේසිංහ මාවත, දේසිංහ මාවතේ වරි. අංක 159/48 දරන ඉඩම සහ සාම මාවතේ වරි. අංක 225/106 දරන ඉඩම.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

යොමු අංකය: 4/3/4/2011/ඩී/306.
2012 මැයි මස 22 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
අංක 1200/06, "මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

07 – 400

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.